රු. 5000.00

207906
2014/06/19
ව.

# පාළි අට්ඨකථා තුළින් හෙළිවන ආරාමික සම්ප්‍රදාය

# පිළිබඳ අධ්‍යයනයක්

විතාරන්දෙණියේ චන්දසිරි හිමි
GS/PhD/PALI/1307HU2011001

Library - USJP
207906

දර්ශනශූරී

2013

207906

LB/BK/DON/72/2014

2015+
2020

CR


CR
378.242095493
CHA

207906

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය, අභ්‍යන්තර පර්යේෂණ උපදේශක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, පූජ්‍යපාද මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේගේ හා බාහිර පර්යේෂණ උපදේශක, සේවාර්ජිත මහාචාර්ය, ඔලිවර් අබේනායක මැතිතුමාගේ සදුපදේශයෙන් ද පුස්තකාල අධ්‍යයනය තුළින් දත්ත රැස් කිරීමෙන් ද මවිසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබුවකි. මෙය මෙම විශ්වවිද්‍යාලයට හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් හෝ නිබන්ධයක කොටසක් හෝ නො වන බවත් සහතික කරමි.

මෙයට,



පර්යේෂක,

විතාරන්දෙණියේ චන්දසිරි හිමි

GS/PhD/PALI/1307HU2011001

# උපදේශකවරුන්ගේ අනුමැතිය

වාචික පරීක්ෂණයේ දී පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුළත් කර ඇති බව මෙයින් සහතික කරමි.

01. අභ්‍යන්තර උපදේශක :

............................................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, මාගම්මන පඤ්ඤානන්ද හිමි

02. බාහිර පර්යේෂණ උපදේශක :

............................................................

සේවාර්ජිත මහාචාර්ය ඔලිවර් අබේනායක

18 DEC 2013

# පිදුම

හෙළා ගත දා බිඳුත්

දරා අත කරගැටත්

ගිරි දුර්ග පසු කෙරූ

පහන් ටැඹ නුඹම විය,

සිව් බඹ ගුණ සිත දැරූ..

මුහුර්තිය නුඹ නොවේ ද

උත්තරීතර මව් පදවියේ.....

මෝ තිමිර පට ඉරා

නිසි මග ම පෙන්ව වූ,

උතුම් ගුරු දේවයනි......

පා නැමැද පුදමි මම..

කුළුණු සිත් පෙරදැරිව..

# සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| අනි | - | අංගුත්තරනිකාය |
| අනිඅ | - | අංගුත්තරනිකායට්ඨකථා |
| අපඅ | - | අටුවා පරීක්ෂණ හා අටුවා කථාවස්තු |
| අපඅට් | - | අපදානට්ඨකථා |
| අපා | - | අපදාන පාළි |
| අපානි | - | අභිධානප්පදීපිකා නම් වූ පාළි නිඝණ්ඩුව |
| අබු | - | අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ |
| අසාඅර | - | අට්ඨකථා සාහිත්‍යය හා අටුවා රසකථා |
| අසංසිශ | - | අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය |
| ඉවුඅ | - | ඉතිවුත්තකට්ඨකථා |
| උඅ | - | උදානට්ඨකථා |
| උපා | - | උදාන පාළි |
| ඌපුම | - | ඌනපූරණ සහිතො මහාවංසො |
| කාමකා | - | කාව්‍යශේඛරය මහා කාව්‍ය |
| බුපාඅ | - | බුද්දකපාඨට්ඨකථා |
| චපිඅ | - | චරියාපිටකට්ඨකථා |
| චබාඅ | - | චතුබාණවාරට්ඨකථා |
| චුනිඅ | - | චුල්ලනිද්දේසට්ඨකථා |
| චුපා | - | චුල්ලවග්ග පාළි |
| ඡසංසංතැ | - | ඡට්ඨ සංගායනා සංයුක්ත තැටිය |
| ජාඅ | - | ජාතකට්ඨකථා |
| ත්‍රිප | - | ත්‍රිපිටක පරීක්ෂණ |
| ථෙඅ | - | ථෙරගාථාට්ඨකථා |
| ථෙගාඅ | - | ථෙරීගාථාට්ඨකථා |
| ථෙගාපා | - | ථෙරගාථා පාළි |

| | | |
|---|---|---|
| ථෙබෞදාස | - | ථෙරවාදී බෞද්ධ දාර්ශනික සංස්කෘතිත සමීක්ෂා |
| දස | - | දහම් සරසවිය |
| දහැ | - | දර්ශනයඃ හැඳින්වීමක් |
| දීනි | - | දීඝනිකාය |
| දීනිඅ | - | දීඝනිකායට්ඨකථා |
| ධපඅ | - | ධම්මපදට්ඨකථා |
| ධපා | - | ධම්මපද පාළි |
| ධසංපඅ | - | ධම්මසංගණිප්පකරණට්ඨකථා |
| ධාම | - | ධාතු මඤ්ජුසා |
| නිසං | - | නිකාය සංග්‍රහය |
| පපා | - | පරිවාර පාළි |
| පපඅ | - | පඤ්චප්පකරණට්ඨකථා |
| පමඅ | - | පටිසම්භිධාමග්ගට්ඨකථා |
| පාඅපිවස | - | පාලි අට්ඨකථාවන්හි පිළිබිඹු වන ව්‍යාකරණ සම්ප්‍රදාය |
| පාඅසා | - | පාලි අට්ඨකථා සාහිත්‍යය |
| පාභාප | - | පාලි භාෂා පරිචය |
| පාචිපා | - | පාචිත්තිය පාළි |
| පාසා | - | පාලි සාහිත්‍යය |
| පාසාඉ | - | පාලි සාහිත්‍යයේ ඉතිහාසය |
| පාසිංඅ | - | පාලි සිංහල අකාරාදිය |
| පැලබෞඉ | - | පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය |
| පිප | - | පිරිතෙහි පරිණාමය |
| පේඅ | - | පේතවත්ථු අට්ඨකථා |
| ප්‍රාවි | - | ප්‍රාතිමෝක්ෂ විවරණය |
| බුඅ | - | බුද්ධවංසට්ඨකථා |
| බෞඅද | - | බෞද්ධ අධ්‍යාපන දර්ශනය |

| | | |
|---|---|---|
| බෞඅදපිසවා | - | බෞද්ධ අධ්‍යාපන දර්ශනය පිළිබඳ සම්මේලන වාර්තාව |
| බෞආසං | - | බෞද්ධ ආරාම සංවිධානය |
| බෞභිස | - | බෞද්ධ භික්ෂු සමාජය |
| බෞවි | - | බෞද්ධ විනයකර්ම |
| බෞස්රොනිචි | - | බෞද්ධ ස්වස්ථතාව රෝග නිවාරණය සහ චිකිත්සාව |
| බෞසා | - | බෞද්ධ සාහිත්‍යය |
| බෞශිමූව | - | බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශකථාව |
| භිළ | - | භික්ෂුවකගේ උරුමය |
| මඔඅබෞඅවි | - | මහාචාර්ය ඔලිවර් අබේනායක බෞද්ධ අධ්‍යයන විමර්ශන |
| මනි | - | මජ්ඣිමනිකාය |
| මනිඅ | - | මජ්ඣිම නිකායට්ඨකථා |
| මනිඅට් | - | මහානිද්දේසට්ඨකථා |
| මපා | - | මහාවග්ග පාළි |
| මසිංශ | - | මහා සිංහල ශබ්දකෝෂය |
| මාවි | - | මානව විද්‍යාව |
| මිප | - | මිලින්දපඤ්හො |
| මුබුවිගැ | - | මුල් බුදුසමය හා විවරණ ගැටලු |
| ලජාපු | - | ලක්බිම ජාතික පුවත්පත |
| ලබුඉ | - | ලක්දිව බුදු සමයේ ඉතිහාසය |
| ලබුමප | - | ලක්දිව බුදුසසුන හා මහසඟ පරපුර |
| ලංපාසා | - | ලංකා පාලි සාහිත්‍යය |
| ව්‍යාසි | - | ව්‍යාකරණ සද්දසින්ධු |
| වාර | - | වාස්තු රත්නාවලිය |
| වාවිගෘශි | - | වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය |

| | | |
|---|---|---|
| විඅ | - | විභංගට්ඨකථා |
| විමා | - | විසුද්ධිමාර්ගය |
| විවඅ | - | විමානවත්ථු අට්ඨකථා |
| විවිටී | - | විමති විනෝදනී ටීකා |
| සපා | - | සමන්තපාසාදිකා |
| සපිශ | - | සමාජවිද්‍යාව පිළිබඳ ශබ්කෝෂය |
| සවි | - | සමයාන්තර විශ්වකෝෂය |
| සා | - | සාරදා |
| සාදීවිටී | - | සාරත්ථදීපනී විනය ටීකා |
| සුනිඅ | - | සුත්තනිපාතට්ඨකථා |
| සුශ | - | සුමංගල ශබ්දකෝෂය |
| සංනිඅ | - | සංයුත්තනිකායට්ඨකථා |
| සිංබුනි | - | සිංහල බුද්දක නිකාය |
| සිංවි | - | සිංහල විශ්වකෝෂය |
| ශ්‍රස | - | ශ්‍රමණ සම්ප්‍රදාය |
| ශ්‍රීසත්‍රිබු | - | ශ්‍රී සද්ධර්මකෝෂය හෙවත් ත්‍රිපිටක බුද්ධධර්මය |
| AEB | - | An encyclopedia of belief |
| ATHAKN | - | A Textual and Historical Analysis of the Khuddaka Nikaya |
| BMD | - | Buddhist Monastic discipline |
| BML | - | Buddhist monastic life |
| DEBMTBPL | - | Dictionaray of early Buddhist monastic term based on pali literature |
| DSS | - | Dictionary of social sciences |
| EB | - | Encyclopaedia of Buddhism |
| EBB | - | Early Buddhistic Buddhism |

| | | |
|---|---|---|
| EBM | - | Early Buddhist Monarchism |
| ER | - | Encyclopedia of religion |
| EZ | - | Epigraphia Zeylanika |
| GWET | - | Ground work of education theory |
| HDA | - | History and Doctrine of Ajivakas |
| OD | - | Oxford Dictionary |
| PED | - | Pali English dictionary |
| RP | - | Robe and plough |
| SED | - | Sanskrit English Dictionary |
| SMA | - | Sinhalise Monastic Architecture |
| TCMSS | - | The Community of Maha Sangha in Sri Lanka |

## පටුන


පළමු පරිච්ඡේදය

ආරාමය හා සම්ප්‍රදාය : හැඳින්වීම

1.1 ආරාමය : ශබ්දාර්ථ විග්‍රහය 1

1.2 ආරාමයේ ආරම්භය හා විකාශය 6

1.2.1 සම්ප්‍රදාය : ශබ්දාර්ථ විග්‍රහය 18

1.2.2 සම්ප්‍රදාය සංකල්පය 23

1.2.3 සම්ප්‍රදාය අනෙකුත් විෂයන්වලට ඇති සම්බන්ධය 23

1.2.3.1 සම්ප්‍රදාය හා සමාජ විද්‍යාව 23

1.2.3.2 සම්ප්‍රදාය හා දර්ශනය 25

1.2.3.3 සම්ප්‍රදාය හා දේශපාලනය 25

1.2.3.4 සම්ප්‍රදාය හා මානව විද්‍යාව 27

1.2.3.5 සම්ප්‍රදාය හා පුරාවිද්‍යාව 27

1.2.3.6 සම්ප්‍රදාය හා භාෂාව 28

1.2.3.7 සම්ප්‍රදාය හා බුදු දහම 30

1.2.3.8 සම්ප්‍රදාය ආරක්ෂා කිරීම 32

දෙවන පරිච්ඡේදය

බෞද්ධ ආරාමික සම්ප්‍රදාය : අධ්‍යාපනය

2.1 අධ්‍යාපනය : ශබ්දාර්ථ විග්‍රහය 34

2.2 බෞද්ධ අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ 35

2.3 ථේරවාද අධ්‍යාපන සම්ප්‍රදායෙහි ආරම්භය හා ව්‍යාප්තිය 38

2.4 ගුරු ශිෂ්‍ය සබඳතාව 40

2.5 අධ්‍යාපන ක්‍රමය 46

2.6 ඉගැන්වීමේ ශිල්ප ක්‍රම 50

2.6.1 මනෝ විද්‍යාත්මක ක්‍රමය 50

2.6.2 උපමා භාවිතය 52

2.6.3 අනුපිළිවෙල දේශනා ක්‍රමය 53

2.6.4 සාකච්ඡා ක්‍රමය 53

2.6.5 විවාද ක්‍රමය 54

2.6.6 දේශනා ක්‍රමය 55

2.6.7 පැවරුම් භාවිතය 55

2.6.8 තුලනය කිරීම 55

2.6.9 සාමූහික පන්ති ක්‍රමය 56

2.6.10 ශිෂ්‍යයා විචාරශීලීත්වයට යොමු කිරීම 56

2.6.11 ස්වයං අධ්‍යාපනය ලැබීම 57

2.6.12 අකුරු ඉගැන්වීම 57

2.6.13 ස්වාධීනව ක්‍රියා කිරීම 58

තෙවන පරිච්ඡේදය

ආරාමික සම්ප්‍රදාය : විනය

3.1. සාමූහික විනයකර්ම 63

3.1.1 පැවිදි හා උපසම්පදා විනය කර්මය 63

3.1.2 උපෝසථ විනය කර්මය 76

3.1.3 සීමා සම්මත විනය කර්මය 78

3.1.4 වස් විසීම 83

3.1.5 පවාරණය 86

3.1.6 කඨිනස්ථරණ විනය කර්මය 88

3.2 දණ්ඩන ස්වරූපී විනය කර්ම 91

3.2.1 තජ්ජනීය විනය කර්මය 92

3.2.2 නියස්ස විනය කර්මය 92

3.2.3 පබ්බාජනීය විනය කර්මය 93

3.2.4 උක්ඛේපනීය විනය කර්මය 93

3.2.5 පකාසනීය විනය කර්මය 93

3.2.6 බ්‍රහ්මදණ්ඩනය විනය කර්මය 94

3.2.7 තමා තමාටම දඬුවම් කර ගැනීම 94

3.3 ශික්ෂණ පාරිශුද්ධිමය විනය කර්ම 94

3.3.1 පරිවාස 95

3.3.2 මානත්ත 97

3.3.3 අබ්භාන 98

3.4 පරිපාලනමය විනය කර්ම 98

3.4.1 චීවරය සම්බන්ධ විනය කර්ම 98

3.4.2 සේනාසනය සම්බන්ධ විනය කර්ම 99

3.4.3 ආරාම පාලනය සම්බන්ධ විනය කර්ම 99

3.5 ගිහි විනය හා සම්බන්ධ විනයකර්ම 100

3.5.1 පටිසාරණිය විනය කර්මය 100

3.5.2 පත්තනික්කුජ්ජණ විනය කර්මය 100

3.5.3 පත්තුක්කුජ්ජණ විනය කර්මය 101

3.6 නීතිමය විනය කර්ම (අධිකරණය) 101

3.6.1 විවාදාධිකරණය 102

3.6.2 අනුවාදාධිකරණය 104

3.6.3 ආපත්තාධිකරණය 106

3.6.4 කිච්චාධිකරණය 106

3.7 විනය කර්ම විපතට පත්වීම හෙවත් අහෝසි වීම 110

3.7.1 වත්ථුවිපත්ති 110

3.7.2 ඤත්ති විපත්ති 111

3.7.3 අනුසාසවන විපත්ති 111

3.7.4 සීමා විපත්ති 112

3.7.5 පරිස විපත්ති 112

3.8 අධිකරණ සමථ 113

3.8.1 සම්මුඛා විනය 114

3.8.2 සති විනය 114

3.8.3 අමූළ්හ විනය 114

3.8.4 පටිඤ්ඤාතකරණය 115

3.8.5 යෙභුය්‍යසිකා 115

3.8.6 තස්සපාපියය්‍යසිකා 116

3.8.7 තිණවත්ථාරක 116

3.9 බෞද්ධ අධිකරණයක පෙනෙන ලක්ෂණ 116

3.9.1 අධිකරණ විනිශ්චයන් 121

3.10 සංඝ සාමග්‍රිය 124

3.10.1 සංඝ සාමග්‍රිය : හැඳින්වීම 124

3.10.2 භික්ෂූන් වහන්සේලා අතර ඇතිවූ ගැටුම් 127

3.10.3 සමගි වීමේ වටිනාකම 129

3.10.4 අසමගිවීමේ විපාක 131

3.10.5 සංඝ සාමග්‍රිය හෙවත් සමගිය ඇතිකළ අයුරු 132

සිවුවෙනි පරිච්ඡේදය

ආරාම කළමනාකරණය, ආරක්ෂාව හා වත් පිළිවෙත් සම්ප්‍රදාය

4.1 ආරාම කළමනාකරණය 135

4.1.1 මානව සම්පත් කළමනාකරණය 138

4.1.2 භෞතික සම්පත් කළමනාකරණය 147

4.1.3 ආරක්ෂාව 148

4.1.4 පිරිසිදුකම 151

4.1.5 ආරාමික භික්ෂු චර්යාව 153

4.2 ධර්ම දේශනා සම්ප්‍රදාය 154

4.2.1 ධර්මදේශනා ක්‍රම 155

4.2.2 ධර්ම දේශනයට සූදානම් වීම 155

4.2.3 ධර්මදේශකයා සතු විය යුතු ලක්‍ෂණ 157

4.2.4 ධර්ම දේශනයේ අන්තර්ගතය 161

4.2.5 ධර්ම සාකච්ඡා 165

4.3 භික්ෂු දේශපාලනය 166

4.3.1 දේශපාලනය යනු කුමක්ද? 166

4.3.2 ආගමික ප්‍රශ්න වලට භික්ෂුව මැදිහත්වීම 169

4.3.3 දේශපාලනයට උපදෙස් ලබාදීම 171

4.4 පිරිත් සම්ප්‍රදාය 174

4.4.1 පිරිත - ශබ්දාර්ථ විග්‍රහය 174

4.4.2 පිරිතෙහි ආරම්භය 174

4.4.3 චතුභාණවාර පාළිය හා පිරිත 176

4.4.4 චතුභාණවාර පාලියෙහි අන්තර්ගතය 181

4.4.5 පිරිත් දේශනා පැවැත්වීමේ පිළිවෙල 184

4.5 සෞඛ්‍ය සංරක්‍ෂණ සම්ප්‍රදාය 187

4.5.1 කායික රෝග හා ප්‍රතිකාර 194

4.5.2 ප්‍රතිකාර සඳහා භාවිත බෙහෙත් වර්ග හා උපකරණ 197

4.5.3 භික්ෂුව රෝගීන්ට ප්‍රතිකාර කිරීම 200

4.6 බුද්ධ භාෂිතය රැකගැනීම 201

4.6.1 බුද්ධ වචනයේ බෙදීම 201

4.6.2 ධර්ම විනය රැකගැනීමට ගත් ක්‍රියා මාර්ග 208

4.6.3 භාණකවරු 210

4.6.4 බුද්ධභාෂිතය පිළිබඳ භාණක මතවාද 216

4.7 මාංස අනුභවය 222

4.7.1 මාංස : හැඳින්වීම 222

4.7.2 සූකර මද්දව අනුභව කිරීම 227

4.7.3 ත්‍රිකෝටික පාරිශුද්ධිය 233

පස්වන පරිච්ඡේදය

භික්ෂුව හා සමාජය


5.1 ථෙරවාද භික්ෂූන් වහන්සේ 236

5.1.1 භික්ෂූන් වහන්සේ 236

5.1.2 භික්ෂුවගේ අරමුණ 239

5.1.3 භික්ෂුව විසින් නිතර සිහි කළ යුතු ධර්ම 239

5.1.4 භික්ෂුව විසින් කළයුතු කථා 240

5.1.5 භික්ෂුවගේ පිරිහීමේ ලක්ෂණ 240

5.1.6 භික්ෂුවගේ බාහිර පෙනුම 241

5.1.7 භික්‍ෂුවට තිබූ අභියෝග 242

5.2 භික්ෂුවගේ චීවරය 244

5.2.1 චීවරය : අර්ථ විග්‍රහය 245

5.2.2 සිවුරේ ඉතිහාසය 245

5.2.3 සිවුරේ පැහැය 251

5.2.4 සිවුරු පරිභෝජනය කිරීම 252

5.3 භික්ෂුව හා සමාජය 253

5.3.1 භික්ෂුණීන් වහන්සේලා සමග සබඳතා පැවැත්වීම 255

5.3.2 ගිහියන් සමග සබඳතා පැවැත්වීම 256

5.3.3 කාන්තාවන් සමග සබඳතා පැවැත්වීම 260

5.3.4 සබඳතා නො පැවැත්විය යුත්තෝ 263


සයවන පරිච්ඡේදය

ආරාමික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ


6.1 වාස්තු විද්‍යාව : හැඳින්වීම 265

6.2 ආරාමය සඳහා බිමක් තෝරාගැනීම 268

6.3 ආරාමයක ස්වභාවය හා එහි ප්‍රභේද 270

6.4 ආරාමිකාංග 273

6.5 ආරාමික ගෘහ භාණ්ඩ 283

6.6 ආරාමයක දුරුකළ යුතු දෝෂ 283

6.7 ගන්ධකුටිය 286

හත්වන පරිච්ඡේදය

ආගමික සම්ප්‍රදායයන් අනුව ආරාම වර්ග කිරීම

7.1 අන්‍යාගම් : හැඳින්වීම 288

7.2 ආගමික සම්ප්‍රදායයන් 290

7.2.1 පූරණ කස්සප 290

7.2.2 මක්ඛලීගෝසාල 291

7.2.3 අජිතකේසකම්බලී 291

7.2.4 පකුධ කච්චායන 292

7.2.5 සංජය බෙල්ලට්ඨිපුත්ත 293

7.2.6 නිගණ්ඨනාථපුත්ත 293

7.3 තාපසවරු 300

7.4 ජටිලයෝ 306

7.5 පරිබ්‍රාජකයෝ 310

7.6 ආජීවකයෝ 315

7.7 අචේලකයෝ 316

7.8 ආරාම වර්ග 317

නිගමනය 320

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 335

## උපකාරානුස්මෘති

අනේක දුක්ගැහැට දරුවන් වෙනුවෙන් ඉතා සතුටින් විඳදරාගෙන දරුවන්ගේ අභිවෘද්ධිය පැතුවාවූත් ඉන් ජීවිතයේ ලෞකිකව නො ලැබූ සහ නො පැතූ, සතුට, සැනසීම භුක්ති වින්දාවූත් ආදරණීය මෑණියන් ඉතා සෙනෙහසින් සිහිපත් කරන්නේ මෙම අධ්‍යයන නිබන්ධය ද ඇයගේ මහත් සොම්නසට හේතුවන බව මා හොඳින් ම දන්නා හෙයිනි. ඇයගේ අප්‍රතිහත ධෛර්යයත් ඉවසීමත් නො තිබුණේ නම් මා මෙවැනි පර්යේෂණයක් කරනව තබා පැවිදි ජීවිතයේවත් සිටීදැයි සිතීම ද අපහසු ය. පර්යේෂයට උදව් කිරීමට තබා පාසලකට ජීවිතයේ එක් දිනක්වත් ගොස් නොමැති ඇයගෙන් මා ලද අත්දැකීම් හා ජීවිතාබෝධය බොහෝ ය. සංසාර පුරුද්ද තුළ පැවිදිවීමේ ආශාව තිබුණත් දෙමාපිය අවසර නො ලැබීම මත වසර හතක් පමණ පැවිදි වීම පමා විය. තමාගේ අවසාන කාලය බැවින් ඉන් පසු මා අනාථවේයැයි තිබූ අවිනිශ්චිතතාව නිසාත් පවුලේ එකම පිරිමි දරුවා නිසාත් තව ටික කාලයක් පැවිදි වීම පමා වුවත් අකමැත්තෙන් වුවද මාගේ බලවත් ඉල්ලීම මත මා හට ප්‍රව්‍රජ්‍යාව ලබාදුන් ගෞරවණීය ගුරුදේව හපුතලේ සෝමානන්ද නා හිමිපාණන් වහන්සේ ද පුණ්‍යානුමෝදනා පූර්වකව සිහිපත් කරමි.

පිරිවෙන් අධ්‍යාපනය ලබන කාලයේ දියතලාව ශ්‍රී අත්ථදස්සි පිරිවෙනේ ඉගැන්වූ සමස්ත ආචාර්ය මණ්ඩලය ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි. උසස් අධ්‍යාපනය සඳහා හොරණ විද්‍යාරත්න විශ්වවිද්‍යා පීඨයට ඇතුළත් වූවායින් පසු භික්ෂුවකට අධ්‍යාපනයේ දුර ගමනක් යා හැකි බව අවබෝධ කරදුන් ආචාර්යවරු බොහෝ ය. මා සිතන පරිදි මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය බවට පත් වූයේ විද්‍යාරත්නය යි. එය කළෝ එහි සමස්ත ආචාර්ය මණ්ඩලය යි. ඒ අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මීපිටියේ සීලරතන හිමිපාණන්, දොරලියද්දේ ධම්මකිත්ති හිමිපාණන්, ධම්මික පරාක්‍රම ගුරුතුමන් සහ සුසන්ත විජේතුංග ගුරුතුමන් උසස්පෙළ විෂයයන් ඉගැන්වූ ගුරුවරු ය. ඔවුහු සියලු දෙනා ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි. විද්‍යාරත්නය මට විද්‍යාස්ථානයක් මෙන්ම සුන්දර නවාතැනක් ද විය. ඇතැම්විට නිවාඩු කාලයටවත් පංසලට නො යන්න තරම් මට එය සමීප විය. විද්‍යාරත්නයෙහි මා පරිවේණාධිපතිවරු දෙදෙනෙකු යටතේ ඉගෙනගතිමි. ඒ යගිරල මහින්ද හිමියන් හා වර්තමාන පරිවේණාධිපති ඔපල්ලේ ඤාණසිරි හිමියන් යන හිමිවරුන් යටතේ ය. කිසිදිනක මට පිට

ශිෂ්‍යයකු ලෙස නො සැලකූ උන්වහන්සේලා දෙනම ඇතුලූ විහාරස්ථානයෙහි සියලූ භික්ෂූන් වහන්සේලා ද ගෞරවයෙන් සිහිපත්කරමි. ජීවිතයේ කෙනෙකුට ලැබෙන දුර්ලභ අවස්ථාවක් මා විද්‍යාරත්නය තුළින් ලද බව මාගේ හැඟීම යි. එනම් වසර තුනක් පමණ රාජකීය පණ්ඩිත ආචාර්ය හොරණ වජිරඤාණ නා හිමිපාණන් වහන්සේ යටතේ ශික්ෂණය ලැබීමට ලද භාග්‍ය යි. මහා ප්‍රාඥයකු වුවත් ඉතා ලෙන්ගතු මිත්‍රයෙකු ලෙස උන්වහන්සේ මාව ඇසුරුකළහ. කවදා හෝ මා අධ්‍යාපනයෙන් දිගු ගමනක් යතැයි යන හැඟීම උන්වහන්සේ තුළ තිබුණි. එය සැබෑවක් කළ මේ මොහොතේ උන්වහන්සේව ඉතා ගෞරවයෙන් පුණ්‍යානුමෝදනා පූර්වකව සිහිපත් කරමි.

විශ්වවිද්‍යාල ජීවිතයේ දී හමු වූ ඉතා ලෙන්ගතු ගුරුවරයකු මෙන් ම මෙම පර්යේෂණ නිබන්ධයේ අභ්‍යන්තර උපදේශකයාණන් වහන්සේ ලෙස සදුපදේශයන් ලබා දෙමින් මාගේ දියුණුවේදී අප්‍රමාණව සතුටු වෙමින් මා දිරිමත් කරන හා නිරතුරව ම දියුණුව ප්‍රාර්ථනා කරන, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශාධිපති ආචාර්ය අතිපූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේට, සරසවි දිවිය තුළ ශාස්ත්‍රඥානය ලබා දෙමින් දෙපයින් නැගී සිටීමට මග පෙන්වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දුනේශ් ඉන්ද්‍රරත්න ගුණතිලක ඇදුරුතුමන්ට, සම්මානිත මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ ඇදුරුතුමන්ට, මහාචාර්ය ආරියපාල පෙරේරා ඇදුරුතුමන්ට, සේවාර්ජිත මහාචාර්ය ඔලිවර් අබේනායක ඇදුරුතුමන්ට, අරුණ කේ. ගමගේ ඇදුරුතුමන්ට, මහාචාර්ය නායිම්බල ධම්මදස්සි හිමිපාණන් වහන්සේට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුඹුකේ චන්දාලෝක හිමිපාණන් වහන්සේට එළමල්දෙණියේ සාරානන්ද හිමිපාණන් වහන්සේට මහාචාර්ය ඥානදාස පෙරේරා ඇදුරුතුමන්ට, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ඒ වීරසේන ඇදුරුතුමන්ට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගාමිණී රත්න ශ්‍රී ඇදුරුතුමන්ට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යාපාරත්න වීරසේකර ඇදුරුතුමන්ට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අරුණ ශාන්ත වල්පොල ඇදුරුතුමන්ට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වසන්ත මෙන්ඩිස් ඇදුරුතුමන්ට සහ විශ්වවිද්‍යාලයේදී අධ්‍යාපනය ලබාදුන් සියලූ ආචාර්යවරුන්ට ද පුණ්‍යානුමෝදනාව පිරිනමමි.

විශ්වවිද්‍යාල ජීවිතයේ මිත්‍රයන් ලෙස එකට ඉගෙනගත් පනහඩුවේ යසස්සි හිමියන් සහ එස් විජිත කුමාර යන දෙපළ නිබන්ධෝපදේශකයකු ලෙස විශ්වවිද්‍යාල සේවයට බැඳීමට උදව් කළ අය යි. නිරතුරුව පැවිදි ජීවිතයේ අගය පෙන්වා දෙමින් මිත්‍රයෙකුටත් වඩා පියෙකුමෙන්

නිරතුරු සෙවන ලබාදෙන මා සමඟ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ගරු කිතලගම නන්දසාර හිමියන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි. උන්වහන්සේගේ ශිෂ්‍යපුත්‍ර වැල්ලේතොට සුදේව පොඩිහාමුදුරුවන් ද හැකි සෑම අවස්ථාවකදීම උදව් කිරීම සම්බන්ධයෙන් කෘතඥතාව පළකරනු කැමැත්තෙමි. මෙම අධ්‍යයන නිබන්ධය නිම කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාල කාර්ය කාර්යමණ්ඩලය, සෝදුපත් බැලීමෙන් උදව්කළ මුතුමාලි මෙනවිය, පරිගණක පිටු සැකසීමෙන් උදව්කළ කුමාරි විජේවර්ධන මහත්මිය සහ නන් අයුරින් උදව් උපකාර කළ සැම ද සිහිපත් කරන අතර ඒ සියලු දෙනාට පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පලකිරීමට කැමැත්තෙමි.

# සාර සංක්ෂේපය

ආරම්භයේ පටන් ඉතා ක්‍රමවත් ආදර්ශවත් මෙන් ම ලෞකික ලෝකෝත්තර යන උභය අංශයෙන් ම ඵලදායී ආරාමික සංස්කෘතියකට හිමිකම් කියන ථේරවාදී භික්ෂු සම්ප්‍රදාය වර්තමානය වනවිට බෙහෙවින් පරිහානියට පත්වෙමින් තිබෙන බව පැවසීම අතිශයෝක්තියක් නො වේ. බුදුරජාණන් වහන්සේ අනුදන වදාළ ශ්‍රමණ ආකල්ප සහිතව විමුක්තිය බලාපොරොත්තුවෙන් ආර්යමග ගමන් කරන භික්ෂූන් වහන්සේලා සොයා ගැනීමත් වර්තමානය වනවිට අසීරු කාර්යයක් වී තිබේ. එසේ ම තම සම්ප්‍රදාය වන ථේරවාද සම්ප්‍රදාය කුමක් දැයි හරිහැටි විග්‍රහ කරගත හැකි භික්ෂූන් වහන්සේලා සිටින්නේ කී දෙනෙක්දැයි යන්න ගැටලුවකි. දන හෝ නො දන සම්ප්‍රදායයෙන් ඈත් වී අත්තනෝමතිකව සුඛෝපභෝගී හා ආත්මාර්ථකාමී ජීවන රටාවකට යොමු වී ක්‍රියා කිරීම වර්තමාන භික්ෂූන් වහන්සේලා තුළින් විද්‍යමාන වන ප්‍රධාන ලක්ෂණයක් වන අතර ඔවුන් ආරාමික සම්ප්‍රදාය අතහැරදමා ඇති ආකාරයක් වර්තමානයේ පෙනෙන්නට තිබේ.

ලක්දිව ථේරවාද සම්ප්‍රදායයෙහි ඉතිහාසය සොයා ගැනීමට ඇති කදිම මූලාශ්‍රය වන්නේ පාළි අට්ඨකථා සාහිත්‍යය යි. එමනිසා ථේරවාදී භික්ෂු ආරාමික සම්ප්‍රදායයේ ස්වභාවය හා කාර්යභාර්ය පිළිබඳ පාළි අට්ඨකථා ආශ්‍රයෙන් අධ්‍යයනයක් කර ක්‍රි. ව. 5 වන සියවස වනවිට බෞද්ධ ආරාමික සම්ප්‍රදාය කෙසේ සකස් වී තිබුණේ ද යන්න හඳුනාගැනීම ඉදිරි ශාසනික ගමන් මඟට ආදර්ශයකි. එසේම අනෙකුත් ආගමික සම්ප්‍රදායයන්ගේ ද ආරාමික ජීවිතය පිළිබඳ අධ්‍යයනය තුළින් අප සම්ප්‍රදායයේ ඓතිහාසික ස්වභාවය හා අනන්‍යතා ලක්ෂණ වඩාත් හොඳින් ඉස්මතු වී පෙනෙන බැවින් ඒ පිළිබඳ අධ්‍යයනයක් ද මේ සමඟ ම සිදු කෙරේ.

මෙම අධ්‍යයනය තුළින් ථේරවාද බෞද්ධ ආරාමික සම්ප්‍රදයයට අයත් බොහෝ අංශ පිළිබඳව පහත මාතෘකා යටතේ අවධානය යොමුකර ඇත.

- ආරාමය හා සම්ප්‍රදාය : හැඳින්වීම
- බෞද්ධ ආරාමික සම්ප්‍රදාය : අධ්‍යාපනය
- ආරාමික සම්ප්‍රදාය : විනය

- ආරාම කළමනාකරණය, ආරක්ෂාව හා වත් පිළිවෙත් සම්ප්‍රදාය
- භික්ෂුව හා සමාජය
- ආරාමික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ
- ආගමික සම්ප්‍රදායයන් අනුව ආරාම වර්ග කිරීම

ඉහත මාතෘකා යටතේ බෞද්ධ ආරාමික සම්ප්‍රදායයේ පැරණි ස්වභාවයත්, අනෙකුත් ආරාමික සම්ප්‍රදායයන්ගේ ස්වභාවයනුත් හඳුන්වා දීමට බලාපොරොත්තු වන අතර ඒවා සම්බන්ධයෙන් මෙතෙක් හමු නො වූ අලුත් සංකල්ප, තොරතුරු හා ඒ සම්බන්ධව අපගේ අර්ථකථන ද ඉදිරිපත් කිරීමට මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.